අසික්කිත බඩු කෑල්ලක් ! මෙහෙමත් කතා අහන්නේ ! සරයන් කතා කළේ එසේ සිතමිනි.

"අපට දැන ගන්න ඕනෑ මෙහේ කවුරුවත් ඉන්නවද කියලා. අතන වාඩියේ රොත්තට අයිති එවුන් එහෙම ? "

"මොකටද මං එවුන් තියා ගන්නේ ? "

"මම දන්නේ නැහැ නෝනා" මිනිහගේ සැර බාල විය. "ඔබට වැඩකාර කෙල්ලෙක් ඉන්නවා නේද ? ඔබේ මහත්තයා කිව්වා."

"ඔව් ඉන්නවා"

"ඔව් - ඉතින් ඒකිගෙ ළමයි ඉන්නවද ?"

"මම දන්නා තරමින් නම් නැහැ" මැග් ලැෆ් ඒ මුසාව ප්‍රකාශ කළේ ප්‍රබල ස්වරයෙනි. ඔවුන්ගේ ඇස් වෙතට යොමු වූ ඇගේ දෙනෙතින් පිට වූයේ විනෝදයට බර අවංක බවකි.

"වෙන්න පුළුවනි. ඒත් අපි කැමතියි ඒකිට කතා කරලා බලන්න. මේවා වසන් කරන එක නීතියට විරුද්ධයි. නෝනා දන්නවනේ ?"

"ඇත්තටම මම දන්නවා"

ජෝජ් සිටගෙන උන්නේ පොලිස් භටයන් පිටු පසින් පඩි පාමුලය. ඔහුගේ මුහුණෙන් බිරියගේ වචන අනුමත වෙයි. ඇය මෙසේද කීවාය.

"ඔබ මෙතන ඔබේ කාලය නාස්ති කරනවා මං කියන්නේ. ඔබ මගේ කාලයත් නාස්ති කරනවා. ඒත් ඉතින් ආණ්ඩුව තියෙන්නේ ඒකටනේ. නැද්ද ?"

මම දන්නෙ නැහැ නෝනගෙ කතාව මොකක්ද කියලා"

මිනිහගෙ මුරණ්ඩුකම නිසා පියවරක් ඉදිරියට තැබිණ.

"අපිට ඒ කෙල්ල බලන්න පුළුවන්ද ? බැරිද ?"

උරහිසට උඩින් පස්සට ගේ ඇතුළට හඬ ගෑ මැග් ලිෆ් දොරකොඩ නොසෙල්වී සිටගෙන, ලිනෝලියම් අතුළ බිමේ දෙපා අද්ද අද්දා නෙලී අකමැත්තෙන් තමා වෙතට එන හඬට කන් දුන්නාය. ඔවුන් වෙතට එන විටත් තවම ඇගේ අතේ පිඟන් සෝදන රෙදි කඩක් විය. එයින් සබන් පෙණ බිමට වැගිරෙමින් තිබිණ. එළිය අවහිර කරගෙන උන් ලොකු මිනිසුන්ගේ මුහුණු දිහා ඇය කෙළින් බලන්නේ නැත.

"උඹේ දරුවා කෝ මේරි ?" සැරයන් ඇසුවේ බිය වද්දන සමච්චල් ස්වරයෙනි.

"උඹ දරුවා හංගනවා නේද ?"

හිස පහතට හෙළා ගත් නෙලී ගොළුවකු මෙන් හිස වැනුවාය.

"උඹේ දිව බළල්ලු කෑවාද ?" ඔහු විමසීය. "උඹ කතා කරන්නේ නැහැ. ඈං ! බොරු නේද උඹ කරන්නෙ ? !"

"එයාට ළමයි නැහැ" මැග් හරස් කැපුවේ නොරිස්සුම් ගතියකිනි. "මම කිව්වනේ සැරයක්. බළල්ලු ඔබේ කන් දෙක කාලා වගෙයි. ඔහොම කඩා පැනලා - කෑගහලා කෙල්ල පාච්චල් කරන්න ගියොත් උත්තරයක් ගන්නම බැරි වෙයි. ඒ තරම් සුළු දෙයක් වත් තේරුම් ගන්න බැරිද ? ඔබ කෙල්ලව බිය වද්දනවා"

ඇය පොලිස් භටයන් දෙදෙනාගෙන් ඔබ්බට යොමුකළ දෙනෙත් රැඳවූයේ තමා කියන දේ අනුමත කරන සිනහවකින් සෑදුණු සිය සැමියාගේ මුහුණ මතය.

"මේ අහන්න නෝනා" යි සැරයන් තැන කීවේ මේ නැහැදිච්ච ළමිස්සිගෙම ගෙයි සාලයේ දෝරගල්ලේ වැටෙන්නට ඇයට එකක් දෙන්නට හිතේ පවත්නා ආශාව මැඩ පවත්වා ගැනීම නිසා පුපුරන්නට හදන මුහුණින් යුතුවය.

එහෙම නෙවෙයි වාඩියෙ එවුන් අපට කියන්නේ."

"මොකක් නෙමෙයි කියලද ඔවුන් කියන්නෙ ?"

"ඒකිට ළමයි ඉන්න එක්ක ඇත්ත. ඒකි උන් කොහේ හරි හංගලා."

සෙනෙහසින් මෙන්ම කුමක් වේදෝ යන සංකාවෙන්ද ජෝජ් ගේ දෙනෙත් පීඩිතව ඇති බව මැග් දුටුවාය. ඉදිරියට එන්නැයි ඇගේ නෙත් ඔහුට ඇරයුම් කරයි. ඉදිරියට එන්න !

"සාජන් ! ඇය පොලිස් නිලදරුවා ඇමතුවාය." නෙලී පුංචි කෙල්ල කාලෙ ඉඳන් මම දන්නවා. දැන් අවුරුදු හතරක් තිස්සේ මට ගෙදර වැඩට උදව් වෙනවා, එයාට දරුවෙක් ඉන්නවා නම් මම දන්නේ නැහැ කියලා හිතනවාද ? ඇත්තටම ? ඒත් ඔබට උවමනා නම් ගේ සෝදිසි කරන්න පුළුවන්. ගේ විතරක් නෙවෙයි වත්තත් සෝදිසි කරන්න. ඒක නේද ලොකුවට ඕනෑ කරන්නේ වරෙන්තුවක් ඇතත් නැතත් ?"

ඒ කියනවාත් සමග, පොලිස් භටයන් දෙදෙනා කිසි ගරුසරුවක් නැතිව ඇය පසු කර ගෙන ගෙතුළට ගියේ නෙලී මම්බිලර් බිත්තියට තද කරමිනි. සපත්තු හඬ නංවමින් ගෙතුළ ගිය ඔවුහු නිදන කාමරවලටත් මැද සාලයටත් ඇතුළු වී ඉක්බිති කුස්සියට ආහ. අල්මාරි - රාක්කවල දොරවල් බලෙන්ම විවෘත කළහ. රෙදි සෝදන කාමරයේ දොර වසන ලද්දේ මහ හඬ නංවමිනි.

පඩි පෙළෙන් උඩට ආ ජෝජ් බිරියලේ අතින් අල්ලාගෙන ඇය සහ නෙලී ගෙයි පිටි පස්සට කැඳවාගෙන ගියේය. මිදුලේ සිට ගෙට එන පොලිස් භටයන් දෙදෙනා වෙතට හැරුණේ මේ දෙන්නා ඉදිරියෙන් සිටගෙනය.

"දැන හිතට හරි ?"

"නැහැ යාළුවා ! අපේ හිතට හරි නැහැ."

මේ සැරයන් පිළිතුරු දුන්නේ මූසල විදියටය.

"ඇබිත්තක් වත් හරි නැහැ"

ඔවුන් බලසම්පන්න සරීර වලින් මුළු කුස්සියම පිරී ගියාක් බඳු විය. නැවතත් පිඟන් සෝදන බේසම වෙතට ගාටන නෙලී දෙස ඔවුන් බලා සිටියේ පිළිකුලෙනි. නෙලීගේ සිරුර බියෙන් දරදඬුව ගොසින්ය.

"අපි ඔබව විශ්වාස කරන්නේ නැහැ" යි සැරයන් තැන කීවේය. "ඔබ වත් ඔබේ මහත්තයාවත්, ඔය ගොල්ලන්ගේ හොරේ අල්ලගත් දාට හොඳ සෙල්ලම් තියේවි."

කොයි මොහොතේ පොඩි දරුවාගේ හැඬිල්ලකින් හොරය එළිදරව් වේද යන බියෙන් මැග් සිත තද කර ගත්තාය. කඩිසර ලෙස ගින්නේ දර අවුස්සන්නට පටන් ගත්තාය.

"හොඳයි එහෙනම්" ජෝජ් කතා කළේ ඇගෙ අත තද කරමින් අනෙක් දෙදෙනා වෙත තියුණු පැල්මක්ද හෙළමිනි.

"දැන් ඔබලා බැලුවනේ. දැන් ඉතින් යනවද ? අපට තියෙනවා අපේ වැඩ කර ගන්න."

සැරයන් බුම්මාගෙනය. ඔහු සපත්තු බිම අද්දමින් කුස්සියේ ඔබ මොබත්, දොරෙන් බැහැර පිළිකන්නේ ගෙවත්ත වෙතත්, කර පොවන්නට වූයේය. ලැෆී යුවලගේ චූටි දියණිය ඔහුගේ කකුල් දෙක අස්සෙන් රිංගා කලිසම් කකුලෙන් අදින්නට වූවාය. එය ඔහු උමතු කරවන්නක් විය.

"හාං හොඳයි !"

ඔහු එකඟ වූයේ කැමැත්තකින් නොවේ. "හොඳයි" නෙලීගේ පිටුපසට අන්තිම වතාවටත් ඔරවා බැලූ ඔහු "කළු වේසාවියෝ " යි කීවේ අර අහංකාර ලැෆී නෝනා මහත්තමියට හිතාමතාම රිද්දන්ටය. "මුන්ගේ වටිනාකමට වැඩියෙන් කරදර වෙන්න ඕනෑ. ඒකත් තුට්ටුවක් වටිනවයැ."

ජෝජ් තමා කරමින් සිටි ගෙවත්තේ වැඩට ආපසු ගියේය. ගැහැනු දෙන්නා කුස්සියේ ගල් ගැසී බලා උන්හ. අශ්වයන්ගේ ශබ්දය මැකී ගියේය.

පිඟන් සෝදන බේසම වෙතට වන් නෙලීගේ සේදීමේ ඉවරයක් නැත. ඇගේ බැල්ම, සබන් පෙණවලින්, අතුල්ලන රෙදි කඩෙන්, නිමක් නැතිව මදින පිඟන්වලින් ඉවතට යන්නේම නැත. කඳු ගැටයෙන් ඔබ්බට ගිය අසුන්ගේ කුරහඬ හොඳටම නෑසී ගියාට පසුත් එය එසේමය. මැග් ලැෆී රෙදි කඩක් ගෙන පිඟන් පිස දමමින් රාක්කයේ තැන්පත් කරන්නට පටන් ගත් පසුද වෙනසක් නැත.

සිය සැමියා ගේ වටයෙන් අවුත් එළියේ වූ කොක්කක තොප්පිය එල්ලා තබා උඩ පඩිය මත වාඩි වී සපත්තු අඩියට අල්ලා ගත් පස් ඉවත් කරන්නට හදනවා මැග් බලාගෙනය. දරදඬු වී වක් ගැසුණු නෙලීගේ පිටෙන් ප්‍රශ්නයක් පිට ප්‍රශ්නයක් මතු වෙයි. ඇගේ දිගු දුඹුරු ඇඟිලිවලින් ද ප්‍රශ්න මතු වෙයි. ඉවතට හරවා ගත් ඇගේ මුහුණද ප්‍රශ්න අසයි. උර උරා ඉන්නට ලොසින්ජරයක් දී ජෝජ් විසින් නිදන කාමරයේ සීලිමේ සඟවා තබන ලද තැනින් පහළට ගනු ලැබූ ඇගේ දරුවා යන්තමින් අඩි තබමින් කුස්සියට ආ විටත්, නෙලී අර බේසමට ඇලිලා අතට ගත්තු එකම පිඟාන සෝදා - සෝදා සිටියාය.

"මොකද නෙලී මේ ?"

මැග් කරුණාවෙන් කතා කළාය. "මොකද වෙලා තියෙන්නෙ ? අපි ඒ ගොල්ලන්ව පැරැද්දුවනේ. නැද්ද"

ජෝජ් කළු කොළු පැටවාත් සිය දියණියත් අල්ලා දණිස් දෙක මත දෙන්නා තබා ගෙන පද්දන්නට විය. දෙන්නාට මැද්දෙන් දෙපැත්තට හිස වනන්නට විය. චූටි ඇඟිලි ඔහුගේ මුහුණ පහුරු ගාන්නට විය.

අතැඟිලි වලින් සබන් සහ වතුර බේරෙද්දී නෙලී බේසම වෙතින් ඉවතට හැරුණේ හිතන්නට බැරි තරම් හෙමින්ය. කළු දරුවකු හා සුදු දරුවකු හුරතල් කරමින් උන් ජෝජ් දෙස බැලුවත් සිනා සෙන්නට නෙලීට බැරිය.

"අනික් සැරේ එනවා"

ආයෙත් කිසි බලාපොරොත්තුවක් නැතිවය.

ජෝජ් සහ බිරිය ඇය දෙසට නෙත් යොමු කළේ දැඩි අනුකම්පාවෙනි. ඔවුන්ට එය රහසක් නොවේ. ඒ බව ඔවුහුද දනිති.

"අනිත් සැරෙත් අපි ඒකම කරමු."

මැග් ලැෆී පැවසුවාය "ඔයා බය වෙන්න එපා"

එවිට ජෝජ් ලැෆී මෙසේ කීවේය. "මෙහාට ඇවිල්ලා ඉන්න නෙලී. මෙහාට ඇවිත් දිගටම ඉන්න." ඒ කියන එක එක වචනයට හිස වනමින් ඔහුගේ බිරිය එය අනුමත කළාය. හිස වනා සිනාසී මඳක් හැඬුවාය.

"ඔයයි චාලියි දෙන්නම ඇවිත් මෙහේ ඉන්න."

නෙලී කට ඇරියේ විලාප ගහන්නට ය. මොකක්ද මේ ? ඔවුහු අසන්නට වන්හ. මොකක්ද උණේ ? ඒකට කැමති නැද්ද ඔයා ? ගඟ අයිනේ වූ පැරණි ගබඩා මඩුව ඇයට දිය හැකි බව කීය. එහි උඳුනක් දමා පිළිවෙලක් කර දෙන්නට පොරොන්දු වූහ. නෙලීගේ ඇඬිල්ල නැවතුණේ නැත. ඇගේ කළුවන් දෑස් දිය නොසිඳෙන උල්පතක් වගේය. අන්තිමේදී ජෝජ්ට ඉවසිලි නැතිව ගියේය.

"ඔයාට වෙන කරන්න දෙයක් නැහැ. නෙලී" ජෝජ් කීවේය. වෙන මොනවා කියලා කරන්නද ? "මෙහාට ඇවිත් උන්නොත් අපිට පුළුවන් චාලිව ටිකක් බලා ගන්න. ඔයා ආවෙ නැත්නම් ආණ්ඩුවේ මිනිසුන් ඇවිත් ළමයා අරන් යාවි. එහෙම වෙනවාට ඔයා කැමති නැහැ නේද ? ඇයි ඉතින් ඔයා එන්න කැමති නැත්තේ ?"

"මගේ පවුල දාලා එන්න බැහැ" යි නෙලී ඉකි ගසන්නට වූවාය. "මට බැහැ එන්න"

"අනේ දෙවියනේ !"

ජෝජ් මෙසේ මොර ගෑවේ එය කිසි සේත් තේරුම් ගන්නට නොහැකිවය. "ඇයි දෙය්යනේ ! ඒ ගොල්ල ඉන්නේ ගඟ උඩහා හැතැප්මක් එහායින් නෙවැ" බිරියගේ අතැඟිලි තමාගේ අතට තද වෙමින් කිසියම් පනිවුඩයක් කියන බව මේ අතර ඔහුට දැනුණේය. "ඔයාට ඕනෑ වෙලාවක ඒ ගොල්ල බලන්න යන්න ඇහැකිනෙ."

"ඒත් ඒක වෙනයිනෙ" නෙලී ඉකි බිඳිමින් අවධාරණය කළාය. "ඒක වෙනයිනෙ"

ජෝජ් කල්පනා කළේ තමාට ඇය කියන දේ වැටහුණා කියාය.

"ඒ කියන්නෙ ජැකී ගැනද ? ඔයාගෙ මනුස්සයත් එක්කන් එන්න ඕනෑද ? වත්තේ වැඩ කරන්න පුළුවන් නෙවැ ?"

ජෝජ් දරුවා නෙලීගේ අතට දුන්නේය. දෙන්නාම දොම්නසින් ඔහු ඉදිරියේ පැද්දෙන්නට වූහ. ඔහුට තවමත් මෙය වැටහිලා නැත.

නාකි මිනිස්සු - නාකි ගැහැනු - මාමලා - නැන්දලා නෑනලා - මස්සිනාලා - අය්යා මලෝ - අක්කා නගෝ - ටින් පැල්පත් - බෝතල් - බල්ලෝ - කිලිටි කම්බිලි - පිනට දෙන දුම්කොළ ටික - සණ්ඩු සරුවල් - ගඟ - ගහ කොළ - ගෝත්‍රයේ සකල නශ්ටාවශේෂ - කාලකන්නිකම - නස්පැත්තිය - අහේනිය !

මේ සියල්ල දැන් ඇගේ සිරුරේ දෙවැනි හමය.

"ඒකම නෙවෙයි"

නෙලී කෙඳිරි ගෑවාය. සිය වසි ගණනාවක් තිස්සේ පවතින ගෝත්‍රික සිහින ඇය ඒ වචන දෙකින් හඬා පවසන්නීය.

"ඒත් - එකම නෙවෙයි නේ !"

